# මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය (TNSWSP)

# පුරප්පාඩු නිවේදනය

දේශසීමා මායිම් ආශ්‍රිත වෙළඳ කටයුතු නියාමනය කිරීමේ නියෝජිතායතන වෙත වෙළඳුන් විසින් දේශසීමා මායිම් හරහා සිදුවන සිය වෙළඳ ප්‍රවාහයන් (ආනයන, අපනයන හා ප්‍රතිනැව්ගත කිරීම්) පිළිබඳ ලේඛන හා දත්ත අවශ්‍යතා ඉදිරිපත් කිරීම සඳහා තනි ප්‍රවේශ කේන්ද්‍රයක් වශයෙන් වෙළඳ ජාතික තනි කවුළු පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් තීරණය කර තිබේ. එවැනි ක්‍රියාවලියක ප්‍රතිඵල ද අයදුම්කරුවන් වෙත ස්වයංක්‍රීය වෙළඳ ජාතික තනි කවුළුව හරහා දැන්විය යුතු ය.

ඒ අනුව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් යෝජිත වෙළඳ ජාතික තනි කවුළු පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා එකී කාර්යය උදෙසාම වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයක් (PIU) ස්ථාපනය කිරීමට තීරණය කර තිබේ. එබැවින්, වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතියේ යෝජිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයේ පහත තනතුරු සඳහා වඩාත්ම සුදුසුකම් සපුරා ලූ අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවීමට තීරණය කර තිබේ.

**සුදුසුකම්**

1) වෙනස්වීම් කළමනාකරණ සහ ධාරිතා සංවර්ධන විශේෂඥ (Change Management and Capacity Building Specialist) (PS 3) (තනතුරු 01)

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ආයතනයකින් ලබාගත් ව්‍යාපාර කළමනාකරණය හෝ පරිපාලනය, මානව සම්පත් කළමනාකරණය, රාජ්‍ය කළමනාකරණ හෝ පරිපාලනය පිළිබඳ මූලික උපාධිය;

**හෝ**

- අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්;
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ආයතනයකින් ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් වඩාත් පිළිගැනේ;

**සහ**

- ධාරිතා සංවර්ධන, පුහුණු සහ වෙනස්වීම් කළමනාකරණය පිළිබඳ අවම වශයෙන් වසර 08 ක පළපුරුද්ද (ඉහත පළපුරුද්ද සඳහා විශේෂයෙන් රජයේ හෝ රාජ්‍ය අංශයේ ව්‍යාපෘති හෝ වෙළඳාම සඳහා පහසුකම් සැපයීමේ පසුබිමක් තුළ ලද සෘජු පළපුරුද්ද වඩාත් පිළිගැනේ); සහ
- අවම වශයෙන් වසර 04 ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද වඩාත් පිළිගැනේ.

2) අධීක්ෂණ සහ ඇගයීම් නිලධාරී (Monitoring and Evaluation Officer) (PS 5) (තනතුරු 01)

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ආයතනයකින් ලබාගත් ව්‍යාපාර හෝ රාජ්‍ය පරිපාලන, රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ මූලික උපාධිය; හෝ
- අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්;
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ආයතනයකින් ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් වඩාත් පිළිගැනේ; සහ
- සමාන ප්‍රමාණයේ විෂය පථයක් සහිත සංකීර්ණ ව්‍යාපෘති හෝ ආයතනවල අධීක්ෂණ සහ ඇගයීම් කටයුතුවලට අදාළව අවම වශයෙන් වසර 03ක පළපුරුද්ද (රජයේ ආයතනයකට අදාළ පළපුරුද්ද වඩාත් පිළිගැනේ); සහ
- අවම වශයෙන් වසර 01ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද සහිත නම් වඩාත් පිළිගැනේ.

**පොදු කොන්දේසි**

- 2025.06.08 වැනි දිනට වයස අවුරුදු 60ට නොවැඩි විය යුතුය.
- වාර්ෂික කාර්යසාධන ඇගයුම මත පදනම්ව වාර්ෂිකව කොන්ත්‍රාත්තුව දීර්ඝ කිරීමට යටත්ව, මාස 24ක කාල සීමාවක් සඳහා අයදුම්කරුවන් කොන්ත්‍රාත් පදනමින් බඳවා ගනු ලැබේ.
- 2025.06.08 වැනි දිනට හෝ ඊට පෙර අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරාලිය යුතු ය.
- පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් සතුය.
- මෙහි සඳහන් නොවන හෝ බඳවා ගැනීමේ ක්‍රියාවලිය තුළ පැන නගින යම් ගැටලුවක් සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් හා එකම තීරණය වේ.
- වැටුප සම්බන්ධයෙන් සාකච්ඡා කර එකඟතාවයකට පැමිණිය හැකි අතර, අනෙකුත් ප්‍රතිලාභ 2019 මාර්තු 05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 හි විධිවිධාන පරිදි තනතුරට අදාළ PS කාණ්ඩය අනුව හිමි වේ.

**අයදුම්කිරීමේ ක්‍රමවේදය**

අධ්‍යාපනික/ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික, සේවා පළපුරුද්ද සහ ජාතික හැඳුනුම්පතෙහි සහතික කළ පිටපත් සහ ඥාතීන් නොවන තමා පිළිබඳ විස්තර ලබාගත හැකි පුද්ගලයන් දෙදෙනෙකු සම්බන්ධ කරගත හැකි දුරකථන අංක සමඟින් විස්තරාත්මක ජීව දත්ත පත්‍රිකාවක් සුදුසුකම් සපුරා ලූ අයදුම්කරුවන් විසින් ලියාපදිංචි තැපැල ඔස්සේ 2025.06.21 වන දින හෝ ඊට පෙර පහත ලිපිනයට ලැබෙන පරිදි යොමු කළ යුතු ය. අයදුම්පත සමග අනෙකුත් ලේඛන අන්තර්ගත ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ විසින් අයදුම්කරන තනතුර සඳහන් කළ යුතු ය.

**ලිපිනය:**
**අධ්‍යක්ෂ ජනරාල්**
**වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව,**
**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,**
**මහ ලේකම් කාර්යාලය, කොළඹ 01.**

**තෝරාගැනීමේ ක්‍රමවේදය**

කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, අසම්පූර්ණ ජීව දත්ත පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම හෝ අවශ්‍ය සියලුම ලේඛන ඉදිරිපත් නොකිරීම නොසුදුසු වීම සඳහා හේතුවක් වනු ඇත.

තනතුරු පිළිබඳ විස්තර ඇතුළුව වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර මෙම වෙබ් අඩවිය වෙත පිවිසෙන්න. **https://www.treasury.gov.lk/web/ministry-of-finance-vacancies**

**ලේකම්**
**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,**
**මහ ලේකම් කාර්යාලය,**
**කොළඹ 01.**
**දිනය: 2025.06.08**